(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(21).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 දෙසැම්බර් 03 බදාදා**

---

**2026 ජනවාරි 06 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2025 නොවැම්බර් 28 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2025 නොවැම්බර් 28 දිනැති අංක 2464/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2025.12.03 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝග,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 71 වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ අරමුදල කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 ඔක්තෝබර් 31 දිනැති අංක 2460/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.12.03 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— පරිපූරක මුදල,— ශීර්ෂය 240 — වැඩසටහන 02 — † 2025 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන පනස් දහසක් (රු. 50,000,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **240** | - | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 20,000,000,000 |
| | | | මූලධන වියදම් | රු. 30,000,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 50,000,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2025 දෙසැම්බර් 03 දින ඉදිරිපත් කරන ලද 2025 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 5 දක්වා එකතුව රු. 101,394,600,000

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***